

දේවාත්මයක් සහිතව
මෙලොවට වැඩම කළ ඔබ වහන්සේ
සංසාරික ප්‍රාර්ථනය ඔස්සේ යමින්
අප වැනි අසරණුන් උදෙසා
ශාන්ති සේවාවේ යෙදුනු සේක.

සෑම ශාස්තෘ වරයෙකු සේම
ඔබ වහන්සේත්
ශරීරය නම්වූ භෞතික පදාර්ථය හැර දමා ගොසිනි.

එහෙත් සෑම අතීත ශාස්තෘවරයෙකු සේම
ඔබවහන්සේගේ ලෝකෝත්තර අධ්‍යාත්මය
නොනැවතී අසරණුන් උදෙසා
මාර්ගය පෙන්වනු නිසැකය.

අසූහත් වසරක දිවිය පුරා
තැබූ හැම පියවරක්ම තැබුණේ
පරාර්ථය උදෙසාය.

එහෙයින් ඔබවහන්සේට
පෑගුනු සෑම වැලි කැටයක්ම
ශාන්ති බලයකින් යුක්තවේ.

නිර්වාණය තෙක්වන සංසාරික ගමනේ
පාරමිතා පිරීම උදෙසා ඔබ වහන්සේ
අප වෙතට නොබෝ දිනකින් වඩිනු නිසැකය.

එතෙක් ඔබ වහන්සේ අනුදත්
මගෙහිම යන්නට අපි අදිටන් කර ගනිමු.

ඇසතෝ මා සද්ගමය
තමසෝ මා ජ්‍යෝතිර් ගමය
මිත්‍යෝර්මා අම්රිතම් ගමය
ඕම්! ශාන්ති... ශාන්ති... ශාන්ති...